**ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනය - 2017**

**-------------------------------------------------**

ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනතේ 18 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ආයතනයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ආයතනයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මතය

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතනයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 01**

භාණ්ඩාගාර බිල්පත් හා ස්ථාවර තැන්පතුවල මාස 03 සිට අවුරුදු 01 ක දක්වා ආයෝජනය කරන ලද එකතුව රු. 724,799,416 ක් ප්‍රමිතයේ 76 වගන්තිය පරිදි ජංගම වත්කම් යටතේ පෙන්විය යුතු වුවද ඊට පටහැනි ලෙස ජංගම නොවන වත්කම් යටතේ දක්වා තිබුණි.

**(ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07**

ප්‍රමිතියෙහි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිත කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු. 30,903,039 ක් වූ ස්ථාවර වත්කම් අයිතම 05 ක් සම්පූර්ණයෙන් ක්ෂය කර ඇතත්, තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය, ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී පුද්ගලික සමාගමක් වෙත ගෙවන ලද රු. 9,395,308 ක අත්තිකාරම් මුදල, අත්තිකාරම් ගිණුමට හර කිරීම වෙනුවට ලැබිය යුතු ගිණුමට හරකර තිබුණි.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2011 සහ 2012 වර්ෂ වෙනුවෙන් බස් සමාගමකින් වෛද්‍ය ආයතනය වෙත අයවිය යුතු රු.742,312 ක මුදලක් විගණිත දිනය වූ 2018 ජුනි 01 වන දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයෙන් ආයතනය වෙත, වෛද්‍ය සේවා ගාස්තු ලෙස රු. 4,263,078 ක මුදලක් අයවිය යුතුව තිබූ අතර නිදහස් ගමන් බලපත්‍ර ගාස්තු ලෙස ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය වෙත ආයතනය විසින් රු. 10,253,596 ක් ගෙවිය යුතුව පැවතුණි. එම ගෙවිය යුතු මුදලින් 2012 වර්ෂයේ සිට පවතින රු. 1,470,832 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ලිඛිත ගිවිසුමකින් තොරව කුලී පදනම මත ලබා දී තිබූ ගොඩනැගිල්ලක් හා ආරක්ෂක සේවා සැපයීම වෙනුවෙන් කළුතර ප්‍රදේශයේ රියදුරු පාසලකින් 2011 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා එකතුව රු. 7,758,267 ක් අයවිය යුතුව පැවතුණි.

## 2.4 නීති රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවූ අවස්ථා නිරීක්ෂණය විය.

| | නීති රීති හා රෙගුලාසිවලට යොමුව | | අනුකූල නොවීම් |
|---|---|---|---|
| (අ) | 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වෙනි වගන්තිය හා 2003 ජුනි 02 දිනැති පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.2 වගන්තිය | | ආයතනය සතු මුදල් ආයෝජනය කිරීමේදී මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය හා අදාළ අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගත යුතු වුවත්, ඊට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත ආයතනය විසින් සමාලෝචිත වර්ෂය අවසානයේදී රු.764,290,371 ක මුදලක් ස්ථාවර තැන්පතු, භාණ්ඩාගාර බැඳුම්කර හා භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කර තිබුණි. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | |
| | (i) මුදල් රෙගුලාසි 715 (2) | | භාණ්ඩ භාර ගැනීම හා නිකුත් කිරීම් යන කාර්යයන් පවරනු ලබන නිලධාරියෙකු විසින් ඉටුකළ යුතු වුවද, එසේ නියමිත පුද්ගලයෙකු ගබඩා භාරකරු ලෙස නම්කර නොතිබුණු අතර, තොග අයිතම වෙන වෙනම නිලධාරීන් කීපදෙනෙකු භාරයේ පවත්වාගෙන යන අතර, ඒවා නියමිත පරිදි ගබඩාකර නොතිබුණි. |
| | (ii) මුදල් රෙගුලාසි 396 | | නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොකල මාස 06 ඉක්මවා ඇති වටිනාකම රු. 92,852 ක් වූ චෙක්පත් 08 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකර නොතිබුණි. |
| (ඇ) | 2000 ජනවාරි 10 දිනැති අංක පීඑෆ්/පීඊ 5 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) | භාණ්ඩාගාර අනුමැතියකින් තොරව සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත් කර තිබූ චක්‍රලේඛ පදනම් කරගනිමින් ආයතනයේ වෛද්‍යවරු 12 දෙනෙකු වෙනුවෙන් රාජකාරී බාධා, ප්‍රවාහන හා පැමිණ සිටීමේ දීමනා ලෙස මසකට රු.35,000 බැගින් වර්ෂය තුළදී රු.5,047,040ක මුදලක් ගෙවා තිබුණි. |

| | | | |
|---|---|---|---|
| | | (ii) | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව ඖෂධවේදී, විකිරණ ශිල්පීන් හා වෛද්‍ය රසායනාගාර ශිල්පීන් සඳහා මසකට රු.3500 බැගින් වර්ෂය තුළදී නිලධාරීන් 26ක් සඳහා රු.861,400ක මුදලක් විශේෂ රාජකාරි දීමනා ලෙස ගෙවා තිබුණි. |
| | | (iii) | චක්‍රලේඛය ප්‍රකාරව භාණ්ඩාගාර අනුමැතියකින් තොරව වෛද්‍ය නිලධාරීන්ට අමතර දීමනා වශයෙන් වර්ෂය තුළදී රු.3,459,300 ක මුදලක් ගෙවා තිබුණු අතර එම දීමනා ගෙවීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියද විගණනයේදී ඉදිරිපත් නොවීය. |
| (ඇ) | 2014 දෙසැම්බර් 29 දිනැති අංක 29/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | රජයේ නිලධාරීන්ට ලබාදෙනු ලබන විශේෂ අත්තිකාරම් මුදල රු.4,000 ක් වුවත් ඊට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල තීරණය මත එම මුදල ඉක්මවා රු.25,000 ක් දක්වා වැඩිකර වර්ෂය තුළදී නිලධාරීන් වෙත රු. 1,962,500 ක විශේෂ අත්තිකාරම් ලබා දී තිබුණි. |
| (ඉ) | 2015 මාර්තු 26 දිනැති අංක 07/2015 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය යටතේ වාරික 10 කින් අයකර ගැනීමේ පදනම මත නිලධාරීන් වෙත රු. 30,000 ක උත්සව අත්තිකාරම් ලබා දීමට අනුමැතිය ලබාදී වර්ෂය තුළදී රු.6,624,000 ක මුදලක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 236,394,046 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 281,778,132 ක් වූයෙන්, ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 45,384,086 ක පිරිහීමක් ඇති වී තිබුණි. පරිපාලන වියදම් රු. 20,916,399 කින් වැඩි වීම හා වෛද්‍ය සහතික සේවා ආදායම රු. 25,496,331 කින් අඩු වීම ඉහත පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේ රු. 111,147,463 ක් වූ අතිරික්තය 2017 වර්ෂය වන විට රු. 236,394,046 ක් දක්වා වර්ධනය වී තිබුණි. මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා වූ ක්ෂයවීම් නැවත ගැලපීමේදී 2013 වර්ෂයේදී රු. 262,063,043 ක් වූ දායකත්වය 2016 වර්ෂය වන විට රු. 580,079,715 ක් දක්වා ක්‍රමයෙන් වර්ධනය වී තිබුණද සමාලෝචිත වර්ෂයේදී රු. 553,088,712 ක් දක්වා රු. 26,991,003 කින් අඩු වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

#### 4.1.1 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනතේ 3 වන වගන්තියට අනුව ආයතනය විසින් කවර හෝ වර්ගයක මෝටර් වාහනවලට අදාළ අනතුරු හා සම්බන්ධ අවස්ථාවලදී වෛද්‍ය සේවා හා ආධාර සැලසීම, ගෙවිය යුතු වන්දි හෝ අලාභ ප්‍රමාණය පිළිබඳ උපදෙස් හා විශේෂ ගුරු උපදේශ ලබාදීම, ආයතනයේ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා සියළුම දිස්ත්‍රික්කවල සුදුසු වෛද්‍ය නිලධාරී මණ්ඩලයක් පත් කිරීම, කාර්මික ස්වස්ථතාව සහ කාර්මික අනතුරු පිළිබඳව වෛද්‍ය උපදෙස් හා නිර්දේශ ලබාදීම, සියළු විස්තරවලට අයත් මෝටර් වාහන, ශාරීරිකව හෝ මානසික යෝග්‍ය හා ප්‍රවීණ තැනැත්තන් විසින් පමණක් ධාවනය කරනු ලබන හෝ පදවන ලබන බවට ආයතනය විසින්ම හෝ වෙනත් නියෝජ්‍යායතන විමසා හෝ වගබලා ගැනීම හා අදාළ ක්‍රියාත්මක කිරීම් බලධරයන් විසින් පිළිගත යුතු හා ක්‍රියාත්මක කළ යුතු, ප්‍රවාහන වෛද්‍ය කටයුතුවල ප්‍රමිති සකස් කිරීම, සීමා නියම කිරීම යන කාර්යයන් සමාලෝචිත වර්ෂය තුලදී ඉටුකර නොතිබුණි.

### 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1997 අංක 25 දරන ජාතික ප්‍රවාහන වෛද්‍ය ආයතන පනතේ 3 (ආ) හා (ඇ) වගන්ති අනුව බර වාහන ඇතුළු සියළු වර්ගවල මෝටර් වාහනවල රියදුරන් හා ධාවකයින්ට ශාරීරිකව හා මානසික යෝග්‍යතාවය පිළිබඳ සහතික ලබාදීම හා ඔවුන් වෛද්‍ය පරීක්ෂණවලට භාජනය කර ඔවුන්ගේ සුදුසුකම් සහ යෝග්‍යතාවය පිළිබඳ නිර්දේශ ලබාදීම ආයතනයේ කර්තව්‍ය ලෙස දක්වා තිබුණද ආයතනයේ මුළු ආදායමෙන් සියයට 62 ක් උපයා දෙන සැහැල්ලු වාහනවල වෛද්‍ය සහතික නිකුත් කිරීමේ පූර්ණ බලය 1951 අංක 28 දරන මෝටර් රථ ප්‍රවාහන පනතේ 124 හා 126 වගන්තිය අනුව ආයතනය වෙත ලබා දී නොමැති බැවින් එම නීතිමය බලය ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ආ) වෛද්‍ය ආයතනයේ රථ ගාල සඳහා වෙන්කර තිබූ ඉඩමේ කොටසක් ටෙන්ඩර් කැඳවීමකින් තොරව පුද්ගලික ආයතනයකට මාසිකව රු. 75,000 ක මුදලකට 2012 වර්ෂයේ සිට කුලී පදනම මත වාහන නැවැත්වීම සඳහා ලබාදී තිබුණු අතර, ඒ සඳහා ලිඛිත ගිවිසුමකට එළඹී නොතිබුණි.

(ඇ) වෛද්‍ය ආයතනය විසින් ජාතික ගමනාගමන මණ්ඩලයට ගොඩනැගිල්ලක් කුලියට ලබා දීම වෙනුවෙන් 2004 වර්ෂයට පෙර සිටම මාසිකව රු.5,000 ක කුලියක් අයකරමින් තිබුණි. මේ සම්බන්ධයෙන් දෙපාර්ශවය විසින් ලිඛිත ගිවිසුමකට එළඹී නොතිබුණු අතර කුලිය සම්බන්ධ තක්සේරු වාර්තාවක් ලබාගෙන ඒ අනුව කටයුතු කිරීමෙන් මාසික කුලී මුදල වර්තමාන වෙළඳපොළ වටිනාකම අනුව සංශෝධනය කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) යාපනය හා මඩකලපු ශාඛා කාර්යාල පවත්වාගෙන යන ලබන ගොඩනැඟිලිවල, බදු ගිවිසුම 2017 ජූලි 31 හා 2017 ඔක්තෝබර් 31 දින අවසන් වී තිබුණි. යාපනය කාර්යාලයේ බදු ගිවිසුම රු. 35,000 ක්වූ මාසික කුලිය යටතේ වසරක කාලයක් සඳහා දීර්ඝ කර තිබුණු අතර මඩකලපුව ශාඛා කාර්යාලයේ රු. 35,000 ක බදු මුදල රු. 85,000 දක්වා වැඩිකර 2020 ඔක්තෝබර් 20 දක්වා ප්‍රසම්පාදන ක්‍රියාවලිය අනුගමනය කිරීමෙන් තොරව දීර්ඝ කර තිබුණි.

(ඉ) ආයතනයේ ගම්පහ ශාඛා කාර්යාලය ඉදි කිරීම සඳහා හෙක්ටයාර් 0.0083 ක ඉඩම් කොටසක් 2017 ජුලි 04 දින රු. 20,250,000 ක් ගෙවා මිලදී ගෙන තිබුණද, විගණිත දිනය වූ 2018 අප්‍රේල් 20 දක්වා එම ශාඛා කාර්යාලය ඉදි කිරීමට අවශ්‍ය කටයුතු සිදු කර නොතිබුණි.

## 4.3 කාර්ය මණ්ඩල පරිපාලනය

--------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2017 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 215 ක් හා තථ්‍ය කාර්ය මණ්ඩලය 481 ක් වීමෙන් නිලධාරීන් 266 ක අතිරික්තයක් පැවතුණි.

(ආ) ආයතනයේ සාමාන්‍යාධිකාරී සහ ප්‍රධාන ගණකාධිකාරී තනතුරු පුරප්පාඩුව පැවතීම හේතුවෙන් පරිපාලන හා මූල්‍ය බලතල බෙදාහැරීම සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් පැන නැඟී තිබුණි.

(ඇ) ආයතනය සඳහා බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියක් අනුමත කරගෙන නොතිබුණු අතර අනුමත තනතුරු සඳහා අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා ස්ථිර නිලධාරීන් 123 දෙනෙකු බඳවාගෙන තිබුණි. තවද, අවශ්‍යතාවය මත කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතියකින් තොරව කොන්ත්‍රාත්, දවස් වැටුප් හා අර්ධ කාලීන පැය පදනම යටතේ නිලධාරීන් 143 දෙනෙකු බඳවාගෙන තිබුණි.

## 5. තිරසාර සංවර්ධනය

-----------------------

## 5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

-----------------------------------------------

තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂයට අදාලව ආයතනය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳව දැනුවත් වී තිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------------

## 6.1 ප්‍රසම්පාදනය හා කොන්ත්‍රාත් ක්‍රියාවලිය

---------------------------------------------

### 6.1.1 ප්‍රසම්පාදනය

---------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 පරිදි ප්‍රසම්පාදන කාල සටහනක් පිළියෙල කර නොතිබුණි.

(ආ) 2017 වර්ෂයේ ප්‍රසම්පාදන සැලැස්ම අනුව වෛද්‍ය සහතික මුද්‍රණය කිරීම සඳහා රු. 12,000,000 ක ඇස්තමේන්තු පිරිවැයකට ජාතික තරඟකාරී මිල ගණන් කැඳවීම මගින් ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට සැලසුම්කර තිබුණි. මේ අනුව 2016 නොවැම්බර් 23 දින සැහැල්ලු වාහන වෛද්‍ය සහතික 900,000 ක්ද, බර වාහන වෛද්‍ය සහතික 100,000 ක්ද, මාර්ග බලපත්‍ර කවර 6,000 ක් ද මුද්‍රණය කිරීම සඳහා 2016 දෙසැම්බර් 01 දින ප්‍රසම්පාදන දැන්වීම් පළකර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

(i) ප්‍රසම්පාදන අත්පොතෙහි 5.3.1 වගන්තියෙහි දැක්වෙන පරිදි ජාතික ප්‍රසම්පාදන නියෝජ්‍යායතනයේ සම්මත ලංසු ලේඛන යොදාගත යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබුණි.

(ii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 5.3.11 වගන්තිය පරිදි ඇස්තමේන්තු මුදලින් සියයට 1 සියයට 2 අතර ප්‍රමාණයක ලංසු සුරක්ෂණයක් ලෙස එකවර ගෙවන මුදලක් ලබාගත යුතු වුවත් ඊට පටහැනි ලෙස ඇස්තමේන්තුගත මුදලින් සියයට 0.2 ක්වූ රු. 25,000 ක ආපසු ගෙවන මුදල් තැන්පතුවක් ලබාගෙන තිබුණි.

(iii) ආයතන 04 ක් විසින් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර, තාක්‍ෂණික ඇගයීම් කමිටු නිර්දේශය අනුව ලේක්හවුස් ආයතනයෙන් වෛද්‍ය සහතික මුද්‍රණය කර ගැනීමට 2016 දෙසැම්බර් 27 දින තීරණය කර තිබුණි. නමුත් විශේෂ හේතු සඳහන් කිරීමකින් තොරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.1 වගන්තියට පටහැනිව ප්‍රසම්පාදන කමිටුව විසින් රු. 11,040,000 ක මුදලකට රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව වෙතින් සහතික මුද්‍රණය කර ගැනීමට 2016 දෙසැම්බර් 29 දින තීරණය කර තිබුණි. එහෙත් සැහැල්ලු වාහන වෛද්‍ය සහතික 350,000 ක් සහ බර වාහන වෛද්‍ය සහතික 60,000 ක් නියමිත දිනට සපයා නොතිබුණු අතර සපයා තිබූ එම සහතික පත්‍රවලින් 3041 ක් භාවිතා කල නොහැකි මට්ටමේ පැවතුණි.

(iv) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 (ආ) ප්‍රකාරව කාර්යසාධන සුරක්‍ෂණය පිළිගතහැකි ආයතනයක් විසින් නිකුත් කරන ලද සුරක්ෂණයක් මගින් ඉදිරිපත් කළ යුතු අතර, එය වැඩ නිම කිරීමට අපේක්‍ෂිත දිනෙන් පසුව දින 28 ක් දක්වා වලංගු විය යුතුය. ඊට පටහැනි ලෙස 2018 ජනවාරි 05 දිනෙන් අවසන් ගිවිසුම කාලය වූ වර්ෂයක් සඳහා වලංගු වන පරිදි පමණක් කාර්යසාධන සුරක්‍ෂණයක් ඉල්ලා තිබීම හේතුවෙන් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් 2018 ජනවාරි 06 දක්වා පමණක් වලංගු වන කාර්යසාධන සුරක්‍ෂණයක් ලබා දී තිබුණි.

(v) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.16 වගන්ති පරිදි විකල්ප ලංසු ඉදිරිපත් කිරීමට අවසර දී නොතිබියදී එක් ලංසුකරුවකුගේ විකල්ප ලංසුවක් භාරගෙන ඇගයීමට භාජනය කර තිබුණි.

(ඇ) ආයතනයේ නිලධාරීන් වෙත ලබා දීම සඳහා රු. 675,000 ක් වැය කර ටී ෂර්ට් මිලදී ගැනීම සම්බන්ධයෙන් පහත නිරීක්‍ෂණ කරනු ලැබේ.

(i) ආයතනය විසින් සමාලෝචිත වර්ෂයේදී සේවකයින් 417 දෙනෙකු වෙනුවෙන් ටී ෂර්ට් 900 ක් මුද්‍රණය කර සේවකයින් වෙත ලබාදීමේදී ඒ සඳහා වැය වූ සම්පූර්ණ මුදල වන රු. 675,000 ක මුදල ආයතනයෙන් දරා තිබුණි.

(ii) ටී ෂර්ට් මුද්‍රණය කිරීමේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේදී එම ටී ෂර්ට්වල තිබිය යුතු පිරිවිතර සකස්කරවා ගැනීම ශ්‍රී ලංකා ජේෂකර්ම හා ඇඟළුම් ආයතනයෙන් සිදුකරගෙන තිබූ අතර ඒ සඳහා රු. 21,114 ක මුදලක් ගෙවීම්කර තිබුණි. නමුත් ලංසු ඇගයීම් කිරීමේදී තාක්‍ෂණික ඇගයීම් කමිටුව හා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් පිරිවිතර පරීක්‍ෂා කිරීමකින් තොරව ලංසු කරුවන්ගේ මිල ගණන් හා සේවක කැමැත්ත පදනම් කරගෙන සැපයුම්කරුවෙකු තෝරාගෙන තිබුණි.

(iii) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.10 (ඇ) ප්‍රකාරව භාණ්ඩ ප්‍රසම්පාදනයේදී ඇස්තමේන්තුගත කොන්ත්‍රාත් මුදලින් සියයට 10 ට අඩු නොවන යෝග්‍ය මුදලක සුරක්‍ෂණයක් මගින් වගකීම් පිළිබඳ බැඳීම් ආවරණය කළයුතු වුවත්, ඊට පටහැනි ලෙස ප්‍රසම්පාදන කමිටුව විසින් කොන්ත්‍රාත්තුවේ මුළු වටිනාකම වන රු. 675,000 ක මුදලින් සියයට 5 ක් වන ලෙස රු. 33,750 ක මුදලක කාර්යසාධන සුරක්‍ෂණයක් තැබිය යුතු බව තීරණය කර තිබුණු අතර සැපයුම්කරු විසින් එම වටිනාකමට කාර්යසාධන සුරක්‍ෂණයක් ඉදිරිපත් කර තිබුණි.

## 6.1.2 ප්‍රමාද වූ ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂය තුළදී අනුරාධපුර හා නුවර කාර්යාල සඳහා ගොඩනැඟිල්ල බැගින් ඉදි කිරීමට සැලසුම් කර තිබුණද, අවශ්‍ය අනුමැතිය ලබාගැනීමට කටයුතු නොකිරීම නිසා, එම ඉදිකිරීම් කටයුතු 2018 අප්‍රේල් 20 වන විගණිත දින තෙක් ආරම්භකර නොතිබුණි. දැනට මෙම කාර්යාලය කුලී පදනම යටතේ ලබාගත් ගොඩනැඟිලිවල පවත්වාගෙන යන අතර, වර්ෂය තුළදී ඒ සඳහා පිළිවෙලින් රු. 580,000 ක් හා රු. 1,020,000 ක් කුලී මුදල් ලෙස වැයකර තිබුණි.

## 6.2 අයවැය ලේඛනමය පාලනය

ආයතනයේ අයවැයගත ආදායම් හා වියදම් තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී සියයට 14.8 ක සිට සියයට 229 ක් දක්වා පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | | නිරීක්ෂණ |
|---|---|---|---|
| (අ) | තොග පාලනය | | හදිසි මිලදී ගැනීම් අවම වන පරිදි ඖෂධ සම්බන්ධව ප්‍රශස්ථ තොග මට්ටමක් පවත්වාගෙන යාමට කටයුතු කර නොතිබීම. |
| (ආ) | ආදායම් පාලනය | | ආයතනයට අයත් දේපළ කුලී හා බදු පදනම මත ලබාදීමේදී විනිවිදභාවයෙන් යුක්තව ගැනුම්කරුවන් තෝරාගැනීමේ ක්‍රියාවලියක් අනුගමනය කර නොතිබීම, ආදායම් නියමිත කාලවලදී රැස් කර ගැනීමට කටයුතු නොකිරීම. |
| (ඇ) | සේවක දීමනා පාලනය | | චක්‍රලේඛ උපදෙස්වලට පටහැනිව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් සේවකයින් සඳහා දීමනා ගෙවීම. |
| (ඈ) | කොන්ත්‍රාත් පරිපාලනය | | සේවා ගිවිසුම් රහිතව පිරිසිදු කිරීම් හා ආරක්ෂක සේවා ලබා ගැනීම. |
| (ඉ) | අරමුදල් උපයෝජනය | | ආයතනයේ අරමුදල් නිසි අනුමැතියකින් තොරව බාහිරව ආයෝජනය කිරීම හා ජංගම ගිණුම්වල අතිරික්ත මුදල් ඌන උපයෝජිතව පවත්වාගෙන යාම. |
| (ඊ) | වාහන උපයෝජනය | (i) | අදාළ මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු නොකිරීම. |
| | | (ii) | ලොග් පොත් හා වාහන පිළිබඳ විස්තර පවත්වා නොගැනීම. |
| (උ) | ප්‍රසම්පාදනය | | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අත්පොතේ 5.3.10 වගන්තිය ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛනවල ලංසු වලංගු කාලසීමාවන් සඳහන් කර නොතිබීම. |